# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 21 දරන
# මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ජූනි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ජූනි මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 35 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 21 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 ජූනි මස 23 වන දින.]

එල්. ඩී.—ඕ. 32/82

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 21 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. (මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 14 වන වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වෙන "සලකන දෙපාර්තමේන්තු" යන වචන වෙනුවට "සලකන දෙපාර්තමේන්තු හෝ නියෝජිතායතන" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන පනතේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 1980 අංක 43 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "ඇ උපලේඛනයෙහි" යන යෙදුම වෙනුවට "ඇ උපලේඛනයෙහි හෝ ඈ උපලේඛනයෙහි" යන යෙදුම ආදේශ කිරීමෙන්; සහ

(ආ) "තුළම බලාත්මක විය යුතු ය." යන වචන වෙනුවට පහත දක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"තුළම බලාත්මක විය යුතු ය:

එසේ වුවද කොමිෂන් සභාව විසින් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ කිසිම අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක්, නියමයක් හෝ නිවේදනයක් සෑදීම හෝ නිකුත් කිරීම හෝ ඒ පනත යටතේ යම් බලයක් හෝ කර්තව්‍යයක් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම ඒ පනතින් පිහිටුවන ලද මධ්‍යම පාරිසරික අධිකාරියේ අදහස් විමසීමෙන් පසු සහ එහි එකඟත්වය ඇතිව මිස කරනු නොලැබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (2) වන උපවගන්තිය එහි දක්වෙන "අවුරුදු පහක" යන වචන වෙනුවට "අවුරුදු තුනක" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. පහත දක්වෙන අලුත් උපලේඛනය ඇ උපලේඛනයට ඉක්බිති වම එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කෙරෙන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ ඈ උපලේඛනය ලෙස බලාත්මක විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් ඈ උපලේඛනය එකතු කිරීම.

“ ඇ උපලේඛනය (20 වන වගන්තිය)

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත.

1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත.

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත.

1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත.

1982 අංක 17 දරන සමාගම් පනත ”.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.